# කුරුවිට අධ්‍යාපන කොට්ඨාසය
# Kuruwita Educational Division

දෙවන වාර පරීක්ෂණය - 2019 | 9 ශ්‍රේණිය
**Second Term Test - 2019** | **Grade 9**

සිංහල I
**Sinhala I**

පැය එකයි
**One hours**

සැකසුම - **ර/ කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය**

නම :..........................................................................................................................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක (01) සිට අංක (10) තෙක් ඇති සියලු ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(01). චිරන්තන සිංහල සාහිත්‍ය ග්‍රන්ථ 03 ක් ලියන්න.

(02). සද්ධර්මරත්නාවලිය ලියා ඇත්තේ කවුරුන් විසින් ද? එය කුමන යුගයට අයත් වේ ද?

(03). මහධන සිටුපුත්හුගේ වස්තුව උපුටා ගෙන ඇති ග්‍රන්ථය නම් කරන්න.

(04). දැසේ නිල් පැහැය නැමැති පද්‍ය පන්තිය නිර්මාණය කර ඇත්තේ කවුරුන් විසින් ද? උපුටා ගෙන ඇත්තේ කුමන කාව්‍ය ග්‍රන්ථයෙන් ද?

(05). ක්‍රියා විශේෂණ හා නාම විශේෂණ පද දෙකක් ලියන්න.

(06). ස්වභාවෝක්තිය හා අතිශෝක්තිය හඳුන්වන්න.

(07). ව්‍යාපාරික ලිපියක් ලිවීමේදී සැළකිලිමත් වියයුතු කරුණු 02 ක් ලියන්න.

(08). කුමාරතුංග මුනිදාස මහතාගේ අත් පොත් සේ පරිහරණය කරන ලද ග්‍රන්ථ 02 ක් නම් කරන්න.

(09). සිංහල ළමා සාහිත්‍යයේ ආරම්භක අවධියේ දායකත්වය සැපයූ නිර්මාණ කරුවකුගේ නමක් ලියන්න.

(10). පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ
. . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . .
යන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. ( ලකුණු 20 )

(11). කාලාන්තරයක් තිස්සේ ගන වනයේ සැඟ වී තිබූ අවුකන බුදුරුව දැකීමෙන් විස්මයට පත්වූයේ,
i. පාහියන්ය ii. බ්‍රෝහියර්ය iii. සාපියන්ය iv. විද්වතුන්

(12). පැරණි සම්භාව්‍ය පොත් ඇතුළත් පිළිතුර වන්නේ,
i. සුභාෂිතය, පූජාවලිය, අමාවතුර, කව්සිළුමිණ
ii. ශික්ෂා මාර්ගය, අත්තනගලු වංශය, පූජාවලිය, කියවන නුවන
iii. හත්පණ, මුවදෙව්දාවත, හීන්සැරය,, සුභාෂිත
iv. ලක්මිණි පහන,, කව්සිළුමිණ, කුමාර ගී, සසදාව

(13). යංශය, රේඵය, රකාරාංශය, ගයනුකිත්ත පිළිවෙළින් යෙදුණු පද පේළිය තෝරන්න.
i. වෛද්‍ය, ද්‍රව්‍ය, වර්ගීය, නෛඍකාව ii. **වෛද්‍ය, රකාරාංශය ද්‍රව්‍ය, නෛඍකාව, වර්ගීය**
iii. වෛද්‍ය, වර්ගීය, ද්‍රව්‍ය, නෛඍකාව iv. **ද්‍රව්‍ය, රකාරාංශය වෛද්‍ය, වර්ගීය, නෛඍකාව**

(14). කියත උන් මෙතෙඑල - ආයේය ඇඳුරු ගුත්තිල '' කියත '' යන පදය,,

i. නාම පදයකි
ii. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි.
iii. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි
iv. ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි

(15). මුලින් දී ඇති පදයට අර්ථයෙන් සමාන අර්ථය දෙන පිළිතුර තෝරන්න.

i. තුරග - මිග
ii. පවර - ප්‍රසිද්ධ
iii. ප්‍රභාතය - දහවල්
iv. පුදුමය - ආහ්ලාදය

- හිස් තැනට ගැළපෙන වචනය තෝරා ලියන්න.

(16). පෙළ පොත අධ්‍යනය කිරීමෙන් අපේක්ෂිත . . . . . . . . . . . . . සැබවින්ම සාක්ෂාත් කර ගත හැක.

i. කුසලතාවය
ii. නිපුණතාවය
iii. ශාක්‍යතාවය
iv. විභවතාවය

(17). දහසකුත් ප්‍රශ්න මධ්‍යයේ ඇය . . . . . . . . . . . . . මෙන් නොසැලී සිටියාය.

i. ඉන්ද්‍ර කීලයක්
ii. ඉන්ද්‍ර ජාලයක්
iii. ඉන්ද්‍ර නීලයක්
iv. ඉන්ද්‍ර තාපයක්

(18). . . . . . . . . . . . . . සැඟැවී පහර දුන් බව හමුදා නිලධාරියා ප්‍රකාශ කළේය.

i. ත්‍රස්තවාදීන්
ii. ත්‍රස්තවාදියෙක්
iii. ත්‍රස්තවාදීහු
iv. ත්‍රස්තවාදියෝ

(19). ළමයින් මත් උවදුරින් බේරා ගැනීමට . . . . . . . . . . . . . මෙන්ම ගුරුවරු ද උනන්දු විය යුත්තාහ.

i. දෙමාපියෝ
ii. දෙමාපියන්
iii. දෙමාපියෙක්
iv. දෙමාපියකු

(20). මහාප්‍රාණ අක්ෂරයක් නොමැති වචනය අඩංගු වරණය තෝරන්න.

i. පාඨය, ග්‍රන්ථය, ඡන්දය, ආඛ්‍යාතය
ii. චන්දන, භේදය, ප්‍රථම, භයානක
iii. අවබෝධය, ධ්‍යාන, භයානක, ප්‍රතිඵල
iv. අසෝෂ, ගිජ්ඣකුට, බුද්ධරත්නය, මූර්ධජ

(21). අකාරාදී පිළිවෙළට යෙදුණු පද පේළිය තෝරන්න.

i. අනුරාධපුරය, පොළොන්නරුව, මහනුවර, සීතාවක
ii. කෑගල්ල, මන්නාරම, මහියංගනය, මහනුවර
iii. කලියුගය, යුගාන්තය, මඩොල්දූව, ගම්පෙරළිය
iv. සසදාවත, කව්සිළුමිණ, සැළලිහිණි සංදේශය, ගිරා සංදේශය

(22). තමන්ට නුපුරුදු කාර්යයක් කිරීමට ගොස් අපහසුතාවයට පත්වීම.

i. ඉගුරුදී මිරිස් ගත්තා වාගේ
ii. ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ
iii. ගමරාළ සිල් ගත්තා වාගේ
iv. අනුන් කැපූ වලේ තමන් වැටුණා වගේ

(23). තමන්ගේ <u>අතීත ක්‍රියා කලාපය යළිත් සිහිපත් කිරීම මගින්</u> වඩාත් යහපත් අනාගතයක් උදා කර ගත හැකිය. ඉරි ඇඳි පදයේ තේරුම වන්නේ,

i. ගවේෂණය
ii. පුනරාගමනය
iii. ප්‍රත්‍යවේක්ෂණය
iv. පාරිශුද්ධය

(24). අනියමාර්ථ නිත්‍ය බහු වචන නාම පදය උක්ත වශයෙන් යෙදී ඇති වරණය තෝරන්න.

i. පියාණෝ දරුවන්ට ඔවදන් දෙති.
ii. සමහරෙක් රැස්වීමට සහභාගී වූහ.
iii. බිඟු රැළ මල්වල පැණි උරමින් බොති.
iv. රජ්ජුරුවෝ උයනට සම්ප්‍රාප්ත වූහ.

(25). නිවැරදි වරණය තෝරන්න.

i. අපි දක්ෂ ක්‍රීඩකයෝ වෙමු.
ii. ඔවුන් දක්ෂ දරුවෝ වෙති.
iii. මම දක්ෂතා පෙන්නුවෙමු
iv. ක්‍රීඩා ගුරුවරු බඳවා ගනු ලැබේ.

- තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(26). බැතිමත්හු දෙවියන් **යදිමින්** පුද පූජා පවත්වා ස්වකීය අපල හා ග්‍රහ දෝෂ **දුරුවේවායි** ප්‍රාර්ථනා **කළහ.**
i. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශීර්වාද ක්‍රියා ii. මිශ්‍ර ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, අවසාන ක්‍රියා
iii. ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා iv. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා

(27). සැතපුම් බාගයක් පමණ විහිදී යන මුහුද හඳුන්වන්නේ,
i. කොළ මුහුද ii. කහ මුහුද iii. නිල් මුහුද iv. රතු මුහුද

(28). රත්න ශ්‍රී විජේසිංහගේ කෘතියක් වන්නේ,
i. වෙළෙන්දී ii. ගඟ ලඟදී
iii. සරුපොළොවක් අපට ඇතේ iv. සිංදු කියන උණ පැඳුර

(29). සුදන වෙස් ගත් දුදනා වගේ,
i. උපාසක බළලාය ii. හොර බළලාය iii. වල් බළලාය iv. නපුරු බළලාය

(30). ආනන්ද කුමාරස්වාමි උපන් වර්ෂය මාසය දිනය හා නගරය වන්නේ,
i. 1887.08.22 බොරලැස්ගමුවේදීය ii. 1857.08.22 තංගල්ලේදීය
iii. 1867.08.22 බොරැල්ලේදීය iv. 1877.08.22 කොල්ලුපිටියේදීය

(31). ' අසෙනිපාතය '' හා '' යදඬෙකින් '' යන වචන දෙකේ තේරුම වන්නේ,
i. හෙණ ගැසීම හා පිත්තල දණ්ඩ ii. හෙණ ගැසීම හා යකඩ දණ්ඩ
iii. හෙණ ගැසීම හා තඹ දණ්ඩ iv. හෙණ ගැසීම හා රන් දණ්ඩ

(32). භාෂා ව්‍යවහාරයේ වෙනස්කම් දැකිය හැක්කේ,
i. ජීවත්වන පරිසයේ භූගෝලීය සාධක හා ජීවනෝපාය මාර්ග අනුව
ii. ජීවනෝපාය හා භූගෝලීය සාධක අනුව
iii. ජීවත් වන පරිසරයේ වාතය හා සුළඟ අනුව
iv. ජීවත් වන පරිසරයේ ශබ්දය, වාතය ජීවනෝපාය මාර්ග අනුව

(33). නවම් මහේ නව වළල්ල නැමැති පාඩම උපුටා ගෙන ඇති කෘතිය හා කතුවරයා වන්නේ,
i. දයාසේන ගුණසිංහගේ රන් තැටියක කඳුළු කාව්‍ය සංග්‍රහයේය.
ii. ඔරුමාන්කුලමේ චන්දන හිමියන්ගේ වෙරළ නැමැති කෘතිය.
iii. ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලිය.
iv. රෙජිනෝල්ඩ්ගේ අභිනව අරාබි නිසොල්ලාය.

- හිස් තැන් පිරවීමට යෙදිය හැකි නිවැරදි පදය වරහන් තුළින් තෝරන්න.

(34). එක් අයෙක් බොරු . . . . . . ( කියයි/කියති )

(35). ගුරුවරු . . . . . . . . . . . ( අපට/අපිට ) අවවාද දෙති.

(36). ගොවියෙක් උදැසන කුඹුරට . . . . . . . ( එයි / එති )

(37). අයෙක් . . . . . . . . . . . සුරා මතින් ( නටති / නටයි )

(38). තෙරුන් වහන්සේ දහම් දෙසූ ( සේක / දෙසයි )

(39). පහත දැක්වෙන ප්‍රකාශයේ තනි පදය තෝරන්න.
අපරාධයක් කිරීමට රහසේ කරන කතා බහ
i. සම්මන්ත්‍රණය ii. මන්ත්‍රණය iii. කුමන්ත්‍රණය iv. සතරකන්මන්ත්‍රණය

(40). පුවත් පත් සිරස්තල වර්තමාන කාල ආඛ්‍යාතයෙන් තැබීම ආරම්භ කරුණු ලැබුවේ.
i. ප්‍රබන්ධ සංග්‍රහයෙනි ii. සුබස සඟාරාවෙහි
iii. ප්‍රබන්ධෝප දේශයෙනි iv. ලක්මිණි පහනෙහි

# කුරුවිට අධ්‍යාපන කොට්ඨාසය
# Kuruwita Educational Division

දෙවන වාර පරීක්ෂණය - 2019 | 9 **ශ්‍රේණිය**

**Second Term Test - 2019** | **Grade 9**

සිංහල
**Sinhala**

පැය එකයි
**One hours**

පාසල - **ර/ කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය**

## පිළිතුරු පත්‍රය

(01). අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, පන්සිය පනස් ජාතය, ජාතක පොත, ධාතු වංසය, සද්ධර්මාලංකාරය, දළදා සිරිත

(02). ධර්මසේන හිමි, දඹදෙණි යුගය

(03). සද්ධර්මරත්නාවලිය

(04). දයාසේන ගුණසිංහ කවියා විසිනි, රන්තැටියක කඳළු කාව්‍ය සංග්‍රහයෙන්

(05). ක්‍රියාවිශේෂණ - සෙමෙන්, වේගයෙන්
නාම විශේෂණ - සුදු නංගී , කපටි ගැහැණිය

(06). යමක් ඇති සැටියෙන් දැකීම.
පවතින තත්ත්වය ඉක්මවා පැවසීම,

(07). අදාළ පරිදි ලකුණු ලබා දෙන්න.

(08). ව්‍යාකරණ හා ක්‍රියා විවරණ

(09). වී.ඩී. ද ලැනරෝල්, කියරෝඩ් පෙරේරා, ආනන්ද රාජකරුණා, මාරී මියුසියස්, කුමාරතුංග මුනිදාස, වී.එස් ධර්ම බන්දු, හියුබස් දිසානායක, ඇලැක්සැන්ඩර් වැලිවිට, මාර්ටින් වික්‍රමසිංහ, පී.ඩී.ඇස්. වීරසූරිය, අලව් ඉන් සැබිහෙළ, චන්‍ද්‍රරත්න මානවසිංහ, කරුණාරත්න අබේසේකර

(10). රත්නදීප පොළව තුළින්
. . . . . . . . . . . . . . . . . .
ධන නිධාන මතුවේ
. . . . . . . . . . . . . . . . . .

| | | | | | |
|---|---|---|---|---|---|
| (11). | 2 | (21). | 1 | (31). | 2 |
| (12). | 1 | (22). | 4 | (32). | 1 |
| (13). | 3 | (23). | 3 | (33). | 2 |
| (14). | 2 | (24). | 2 | (34). | 2 |
| (15). | 2 | (25). | 1 | (35). | 1 |
| (16). | 2 | (26). | 1 | (36). | 1 |
| (17). | 1 | (27). | 2 | (37). | 1 |
| (18). | 2 | (28). | 4 | (38). | 1 |
| (19). | 1 | (29). | 1 | (39). | 3 |
| (20). | 2 | (30). | 4 | (40). | 4 |